**දමන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.1,104,958 ක් දරමින් ඉදිකරන ලද කසල කළමණාකරණ ගොඩනැගිල්ල ආදායම් වියදම් ගිණුමේ වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් හිඟුරාණ සතිපොළ වටා වැට ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.3,645,275 ක මුදල ආදායම් වියදම් ගිණුමේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් වටිනාකම හඳුනාගත හැකි රු.8,250,000 ක් වටිනා ඩබල් කැබ් රථයක් හා ත්‍රීරෝද රථයක් සහ වටිනාකම හඳුනාගත නොහැකි ට්‍රැක්ටර් රථයක් මෝටර් රථ හා කරත්ත යටතේ දක්වා නොතිබීම නිසා ස්ථාවර වත්කම් එම වත්කම්වල වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් බෝට්ටු දෙකක් කුලියට ලබාදීමෙන් 2016 වර්ෂය සඳහා ලැබිය යුතු ආදායම වන රු.42,000 ක මුදල වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව රු.33,712 ක නාම පුවරු ආදායම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**
---------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| ගොඩනැගිලි නඩත්තුව | 62,468 | නඩත්තු වියදම් ලේඛනය |
| හිඟ හිටි අක්කර බදු | 230,850 | අක්කර බදු ලේඛනය |
| මෝටර් රථ හා කරත්ත | 23,655 | ස්ථාවර වත්කම් ලේඛනය |

### 1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය සභා රීති 180 හා 181 | ප්‍රාදේශීය සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය, චෙක්පත් නිකුත් කිරීමට අදාල නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |
| (ආ) (i) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්යාල නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 (03.01) | සභාව සතු වාහන 22 සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IA/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව පරිගණක යන්ත්‍ර 05 ක් පැවතිය ද, පරිගණක යන්ත්‍ර උපාංග පිළබඳ ලේඛණයක් පවත්වා ගෙන යනු නොලබයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.2,499,342 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,500,902 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,001,560 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු සහ දඩ හා වරෙන්තු, වෙනත් ආදායම් යන විෂයයන්ගේ සියයට 03 සිට සියයට 66 ක පරාසයක වර්ධනයක් සහ වරිපනම් හා බදු යන ආදායම් විෂයයන්හි සියයට 04 ක පසුබෑමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් දීමනා, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා ආධාර මුදල් හා විශ්‍රාම වැටුප් යන වියදම් විෂයයන්හි සියයට 07 සිට සියයට 1,412 ක පරාසයක වර්ධනයක් සහ ගමන් වියදම්, හා ප්‍රවාහන සම්බන්ධතා යන වියදම් විෂයයන්හි සියයට 01 සිට සියයට 26 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

## 2.3 ආදායම් පරිපාලනය

-----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

-------------------------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, සත්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයට තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් | 420,000 | 420,906 | 1,147,989 |
| කුලී ආදායම් | 2,586,626 | 2,794,140 | 537,331 |
| බලපත්‍ර ගාස්තු | 1,570,400 | 1,557,540 | 83,750 |
| දඩ හා වරෙන්තු ගාස්තු | 940,000 | 932,596 | 390,175 |
| වෙනත් ආදායම් | 780,432 | 891,613 | 1,415 |

### 2.3.2 වරිපනම් හා බදු

----------------

සභාව විසින් අවසන් වරට වරිපනම් තක්සේරුව සිදු කළ 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් අය කිරීම සිදුකර තිබුණි.

හිඟහිටි වරිපනම් ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට නොගෙවූ වරිපනම් රු.1,147,989 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

----------------

ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට නොගෙවූ බලපත්‍ර ගාස්තු රු.83,750 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

-------------------

සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 12 ක් පැවති අතර 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් රු.240,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

----------

2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් රු.203,650 ක් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබුණි.

**2.3.6 උසාවි දඩ**

--------------

2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.390,175 ක් පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නැගෙනහිර පළාත් සභාව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ නැවත ඉදිකිරීම් පුනරුත්ථාපන හා සමාජ සුබසාධන අමාත්‍යාංශය මගින් සභාවට ලබාදුන් වාහන 13 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතුව පවතින වාහන 06 ක් අළුත්වැඩියා කළ යුතු වුවත්, මේ දක්වා අළුත්වැඩියා කිරීමකින් තොරව පැරණි සභා ගොඩනැගිල්ල පිහිටි පරිශ්‍රයෙහි අනාරක්ෂිතව ගාල් කර තිබුණි.

(ඇ) සභාව සතු වාහන 08 ක් සඳහා ආදායම් බලපත්‍ර අදාල වර්ෂයේ දී ලබා නොගැනීම නිසා දඩ මුදල් වශයෙන් රු.6,845 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි.

(ඈ) දැනට සභාව විසින් භාවිතයට ගනු ලබන ඉඩම් 08 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

සභාවට අයත් බෝට්ටු 02 ක් 2009 නොවැම්බර් 12 දින සිට භාහිර පාර්ශවයක් වෙත ගිවිසුම් අත්සන් කර කුළී පදනම මත ලබා දී තිබූ නමුත් ලබාදුන් දිනයේ සිට කිසිදු ආදායමක් සභාව වෙත ලැබී නොතිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට සභාවට ලැබිය යුතු කුළී ආදායම වන රු.293,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සභාව විසින් එම බෝට්ටු නැවත පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

----------------------------------

සභාවට අයත් කැබ් රථය අනතුරකට ලක්වීමෙන් පසු 2009 නොවැම්බර් 17 දින අම්පාරේ පිහිටි පෞද්ගලික ගරාජයට ඇතුලත් කර තිබුණි. මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගේ 2015 සැප්තැම්බර් 28 දිනැති ලිපියේ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණු අතර, අනතුරු සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් ද සිදුකර නොතිබුණි.

**3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

දැයට කිරුල ජාතික ප්‍රදර්ශනය 2013 යටතේ රු.මිලියන 08 ක ප්‍රතිපාදනවලට යටත්ව ඉදිකිරීමට යෝජිත හිඟුරාණ සංචාරක නිවාසයේ වැඩකටයුතු 2013 පෙබරවාරි 27 දින ආරම්භ කර පළමු අදියර ලෙස ගොඩනැගිල්ලේ අත්තිවාරම් කොටසේ ඉදිකිරීම් කටයුතු සිදුකර රු.1,444,162 ක මුදලක් ගෙවීම් කර තිබුණි. එහෙත් එම ගොඩනැගිල්ල ඉදිකරන ස්ථානය පිළිබඳව ඇතිවූ ගැටළුකාරී තත්ත්වයන් නිසා ඉදිකිරීම් නවතා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 13 සිට සියයට 75 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුව ඇත.

| | පද්ධතිය | | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර ගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම. |
| (ආ) | අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල කිරීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත කිරීම. |